T-114

අධ්‍යයන හා විභාග
22 OCT 2013

# ශ්‍රී ලාංකේය අභිචාර විධීන්හි දක්නට ලැබෙන බෞද්ධාගමික ආභාසය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

නම :- අම්පාරේ ආනන්ද හිමි

අංකය :- 2348/ Mphil /2010

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනයෙහි දර්ශනපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම් වස් ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයයි.

Recommended to the Library

23.10.2013.

2013 පෙබරවාරි

# සාරාංශය

ප්‍රාථමික අවධියේ ලොව විසූ මිනිසා පරිසරය හා එහි සංසිද්ධීන් හි අදෘශ්‍යමාන බලවේගයක ක්‍රියා කාරීත්වයක් ඇතැයි විශ්වාස කොට ඒ කෙරෙහි බියමුසු ගෞරවයකින් වන්දනාමාන කිරීමත් සමග අභිචාරාත්මක ක්‍රියා පහළ වී තිබේ. මෙම සුවිශේෂී හැසිරීම් සමුදාය මානව පරිණාමයත් සමග විවිධ වූ මිනිස් අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට භාවිත කිරීම හේතුවෙන් විවිධත්වයක් ද විචිත්‍රත්වයක් ද ගනිමින් වර්තමානය දක්වා ම පැවත එයි. ලොව වෙසෙන සෑම ජාතියක් සතුව ම ඔවුනොවුන්ට ආවේණික අභිචාර විධි දැක ගත හැකි වෙයි. එනමුත් සෑම ජාතියකට ම අයත් අභිචාර විධි අරමුණු අතින් එක හා සමාන ය. ප්‍රාථමික අවධියේ ප්‍රභවය වූ අභිචාර විධි නූතන ලෝකය තුළ ද පැවතීමෙන් පෙනී යන්නේ එමගින් සුවිශාල මෙහෙවරක් මානව සමාජයට ඉටු වී ඇති බවයි. මනෝ චිකිත්සාමය අරමුණ පෙරදැරි කරගත් අභිචාර විධීන් මානව සිත සුවපත් කොට ඒ තුළ ධෛර්‍ය හා විශ්වාසය ගොඩ නැංවී ය. මිනිසාගේ පුද්ගලික ජීවිතය මෙන් ම සමාජගත ජීවිතය ද සකස් කළේ ය. සමාජය ද යහපතට නැඹුරු කළේය. වත්මන් ලෝකයේ විද්‍යාවෙන් හා තාක්ෂණයෙන් ඉටු කර ගත නො හැකි කාර්ය හමුවේ මිනිසාට පිහිට වනුයේ ද අභිචාර විධීන් ය.

ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ ද දුරාතීතයක සිට ක්‍රමාභිවෘද්ධියට පත් අභිචාර විධි සමුදායක් දක ගත හැකි ය. දේශීය ව නිෂ්පන්න එම සුවිශේෂී හැසිරීම් සමුදාය සංක්‍රමණ, ආක්‍රමණ හා අන්‍ය දේශයන් සමඟ ගොඩ නැගුණු සබඳතා හේතුවෙන් විවිධත්වයක් මෙන් ම විචිත්‍රත්වයක් ද ගෙන තිබේ. යකුන්, දෙවියන් හා ග්‍රහයන් මුල් කර ගනිමින් සිදු කරන මෙම අභිචාර විධීන්හි ප්‍රකට ව පෙනෙන සුවිශේෂීතම ලක්ෂණය වන්නේ බෞද්ධාගමික අභිචාර විධි යැයි හැඟෙන තරමට බෞද්ධාගමික මුහුණුවරක් පෙන්නුම් කිරීමයි. පන්සිල් සමාදන් ව ත්‍රිවිධ රත්නයට වැඳ ආරම්භ කරන සෑම අභිචාර විධියක ම අවසානය දක්වා වූ බොහෝ කටයුතු සිදු කරනුයේ බෞද්ධාගමික මුහුණුවරකිනි.

භක්තිවාදී දහමක් නො වන බුදුසමය ආගම වශයෙන් ගත් ජාතියක් තුළ භක්තිය මත පදනම් වූ මෙබඳු අභිචාර විධි සමුදායක් පැවතීම හා ඒවා බෞද්ධාගමික මුහුණුවරක් ගැනීම සඳහා බලපෑ හේතු සාධක පිළිබඳ ව මෙතෙක් ප්‍රමාණාත්මක අධ්‍යයනයක් සිදු කොට නොමැති වීම හේතුවෙන් දේශීය අභිචාර විධීන්හි බෞද්ධාගමික මුහුණුවර සම්බන්ධයෙන්

විවිධ මතවාද ඉදිරිපත් වී තිබේ. එම මතවාද ද සැලකිල්ලට ගනිමින් දේශීය අභිචාර විධි බෞද්ධාගමික මුහුණුවරක් ගැනීම සඳහා බලපෑ හේතු සාධක පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට මෙහි දී අපේක්ෂා කෙරේ.

"**ශ්‍රී ලාංකේය අභිචාර විධීන්හි දක්නට ලැබෙන බෞද්ධාගමික ආභාසය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්**'' යන මාතෘකාව යටතේ සිදු කළ පරිච්ඡේද පහකින් සමන්විත මෙම පර්යේෂණ නිබන්ධයේ පළමු පරිච්ඡේදය වෙන් වනුයේ අභිචාරයන්ගේ ප්‍රභවය හා විකාශය පිළිබඳ සොයා බැලීමට ය. ඒ යටතේ අභිචාර යන්නෙහි වචනාර්ථය ද එය විවිධාර්ථයන් හි යෙදී ඇති අයුරු ද හඳුනා ගනිමින් අභිචාර විධීන් හි ඓතිහාසික පසුබිම, අභිචාර හා සමාජය, අභිචාර හා ආගම, අභිචාර හා විද්‍යාව, අභිචාර හා ආයුර්වේදය, අභිචාර හා මනෝ චිකිත්සාව යන විෂය ක්ෂේත්‍ර ඔස්සේ අභිචාර විධි පිළිබඳ අධ්‍යයනය කෙරේ. ඒ තුළින් අභිචාර විධි බිහි වීම කෙරෙහි බලපෑ හේතු සාධක හඳුනා ගැනීමට ද, ඒවායෙහි සමාජමය කාර්‍ය්‍ය භාරය සොයා බැලීමට ද, ඒවා ආගම හා බැඳී පවතින අයුරු වටහා ගැනීමට ද විද්‍යාත්මක ව දියුණු වූ ලෝකය තුළ ද නො නැසී පවත්නා අභිචාරයන්හි අන්තර්ගත විද්‍යාත්මක පසුබිම අවබෝධ කර ගැනීමට ද, පෙරදිග වෛද්‍ය ක්‍රමය වන ආයුර්වේදය සමග දක්වන සමීප සබඳතාව හඳුනා ගැනීමට ද අභිචාර විධීන්හි පවත්නා මනෝ චිකිත්සාමය පදනම අවබෝධ කර ගැනීමට ද හැකි වී තිබේ.

ශ්‍රී ලාංකේය අභිචාර විධීන්හි බෞද්ධාගමික ආභාසය පිළිබඳ සොයා බැලෙන මෙම අධ්‍යයනයේ දී විමුක්තිය උදෙසා අධි භෞතික බලවේග සරණ යාමක් හෝ ඒවාට පුදපූජා පැවැත්වීමේ අවශ්‍යතාවක් නො දකින, ඒ සඳහා ස්වයං ශික්ෂණයේ මෙන් ම ස්වයං අවබෝධයේ වැදගත්කම හුවා දක්වන බුදුසමය අභිචාර විධි සම්බන්ධයෙන් කෙබඳු ආකල්පයක් දරන්නේ ද යන්න සොයා බැලිය යුතු ම වේ. මෙම පර්යේෂණයේ දෙවන පරිච්ඡේදය වෙන් වන්නේ ඒ වෙනුවෙනි. එහි දී අභිචාර විධි සම්බන්ධයෙන් ආදි බුදුසමයේ ආකල්පය ද ථේරවාද, මහායාන හා තන්ත්‍රයාන යන බෞද්ධ සම්ප්‍රදායන්ගේ ආකල්පයන් ද සොයා බැලීමට අවධානය යොමු කොට තිබේ. ලක්දිව බුදුසමය ව්‍යාප්ත කිරීමෙහි ලා ඉහත සම්ප්‍රදායන් පුරෝගාමී මෙහෙවරක් සිදු කළ හෙයින් දේශීය අභිචාර විධි බෞද්ධාගමික මුහුණුවරක් ගැනීම සඳහා එම සම්ප්‍රදායන්ගෙන් කෙබඳු දායකත්වයක් ලැබී තිබේ ද යන්න

හඳුනා ගැනීමට මෙන් ම ඒ සඳහා පෙළ දහමින් කෙබඳු අනුමැතියක් ඔවුන්ට හිමි වී තිබේ ද යන්නත් සොයා බැලීම එහි අරමුණ විය.

මෙම පර්යේෂණයේ තෙවන පරිච්ඡේදයේදී ලාංකේය අභිචාර විධීන්හි ආරම්භය හා විකාශය පිළිබඳ අධ්‍යයනය කොට තිබේ. එහි දී ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ලාංකේය ජන සමාජය තුළ අභිචාරාත්මක ක්‍රියා පැවති අයුරු ද, ඒවා යුගයෙන් යුගයට ක්‍රමාභිවෘද්ධියට පත් වෙමින් නූතනය දක්වා පැවත ආ අයුරු ද, ඒ සඳහා බලපෑ හේතු සාධක පිළිබඳව ද අවධානය යොමු කොට තිබේ. බැලූ බැල්මට ම බෞද්ධාගමික යැයි හැඟෙන තරමේ බෞද්ධාගමික මුහුණුවරක් පෙනෙන දේශීය අභිචාර විධීන් හි දේශීයත්වය පැහැදිලි ව හඳුනා ගැනීමට ඒ තුළින් හැකියාව ලැබේ.

''බෞද්ධාගමික ආභාසය ලැබූ ශ්‍රී ලාංකේය අභිචාර විධි'' නමින් හඳුන්වන මෙම පර්යේෂණයේ සිවුවන පරිච්ඡේදයේදී බෞද්ධාගමික ආභාසය ලබා ඇති දේශීය අභිචාර විධි පිළිබඳ අවධානය යොමු කොට තිබේ. එයින් ලාංකිකයන් තම ජීවිතයට පැමිණෙන අතුරු අන්තරාවන් වස්දොස් නමින් හඳුනා ගෙන, එම ගුඪ බලය දෙවියන්ගේ, යක්ෂයන්ගේ හා ග්‍රහයන්ගේ බලපෑමෙන් සිදුවෙතැයි කල්පනා කොට, දෙවියන්, යක්ෂයන් හා ග්‍රහයන් උදෙසා පුද පූජා පවත්වන අයුරු ද ඒ සෑම පුදපූජාවක් ම බෞද්ධාගමික ආභාසයක් ගෙන ඇති ආකාරය ද හඳුනා ගත හැකි ය. ශාන්තිකර්ම නමින් හඳුන්වන එම අභිචාර විධීන් හා බැඳුණු උපත් කථා, ඒවාට සහභාගි කර ගන්නා දෙවියන්ගේ හා යක්ෂයන්ගේ උපත් කථා, ශාන්තිකර්මයන් හි භාවිතයට ගැනෙන පූජා ද්‍රව්‍යයන්ගේ උපත් කථා හා ශාන්තිකර්මයන්ගේ පූජා විධි රටාව යනාදි අභිචාරාත්මක ක්‍රියාවන් හා බැඳුණු විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලක්දිව අභිචාර විධීන්හි බෞද්ධාගමික ආභාසය හඳුනා ගැනීමට මෙම පරිච්ඡේදයේ දී උත්සාහ කොට තිබේ.

මෙම පර්යේෂණයේ අවසන් පරිච්ඡේදය ශ්‍රී ලාංකේය අභිචාර විධීන් හි බෞද්ධාගමික ආභාසයට බලපෑ හේතු සාධක හා එයින් ඉටු වූ කාර්‍යභාරය හඳුනා ගැනීමට වෙන් කොට තිබේ. එහි දී බුදුසමයේ සම්ප්‍රාප්තිය ලාංකිකයන්ගේ ආගමික ජීවිතයට බලපෑ ආකාරය ද, දේශීය අභිචාර විධි බෞද්ධාගමික ආභාසයක් ගැනීම සඳහා බලපෑ හේතු සාධක පිළිබඳ ව ද අවධානය යොමු කර යි. ඒ සඳහා ථේරවාද, මහායාන හා තන්ත්‍රයාන සම්ප්‍රදායන්ගෙන්

ලැබුණු දායකත්වය ද සොයා බැලෙයි. දේශීය අභිචාර විධි බෞද්ධාගමික ආභාසය ලැබීම හේතුවෙන් සමාජමය වශයෙන් ඉටු වූ කාර්‍යභාරය ද හඳුනා ගනි යි.

මේ ආදි වශයෙන් පර්යේෂණාත්මක ව කරුණු අධ්‍යයනයේ දී පෙනී යන්නේ දේශීය අභිචාර විධි බෞද්ධාගමික මුහුණුවරක් ගැනීම බුදුසමයේ දුබලතාවක් නිසා හෝ ථෙරවාද බුදුසමයේ පිරිහීමක් නිසා හෝ ඇති වූ තත්ත්වයක් නො ව බව යි. එය පොදුජන අවශ්‍යතා ව අනුව සිදු වූවකි. දේශීය අභිචාර විධි බෞද්ධාගමික ආභාසය ලැබීම හේතුවෙන් ඒවායෙහි මනෝ චිකිත්සාමය වටිනාකම වැඩි දියුණු විය. ඒවා ජීවිත බිලි ගැනීමකින් තොර පූජනීයත්වයෙන් හා අවිහිංසාවෙන් පිරි ක්‍රියාදාමයන් බවට පත් වූයේ බෞද්ධාගමික ආභාසය හේතුවෙනි. සාරධර්ම සන්නිවේදනය කිරීමක් ද සාහිත්‍යමය හා අධ්‍යාපනික මෙහෙයක් ද ඉටු වී තිබේ. ලාංකිකයන්ගේ ආගමික විඥානය තුළ පැවති දෙවියන් පිළිබඳ මෙන් ම විමුක්තිය පිළිබඳ ආකල්පය වෙනස් වී යාම සුවිශේෂී ප්‍රවණතාවකි.